# සයිප්‍රස්හි සොඳුරු සර ප්‍රසංගය



ප්‍රසංගයේ ප්‍රධාන අමුත්තාවන උතුරු මැද පළාතේ ආණ්ඩුකාර කරුණාරත්න දිවුල්ගනේ මහතා මනෝහාරී මහත්මිය විසින් පිළිගනු ලබයි







දිවුල්ගනේ ගායනයේ

**ස**යිප්‍රස් දේශයේ මාසිකව පළවන **සොඳුරු සර** නම් සිංහළ පත්‍රය මගින් සංවිධානය කරන ලද ප්‍රසාංගික උත්සවයකට ආරාධනා ලැබ මම ගිය මස සයිප්‍රස්හි නිකොසියා අග නගරයට ගියෙමි. ඉතා දැකුම් කළු, එසේම ජනාකීර්ණ නොවන සයිප්‍රසය දේශගුණය අතින් හිතකර රටකි. ලන්ඩනය තරම් සීතල නොවූවද උශ්ණත්වය එදා ඉතා පහතට බැස තිබිණ.

එහි වෙසෙන සියළුම ශ්‍රීලාංකික යින් පාහේ රැකියාව සඳහා පැමිණ සිටින තරුණ අයයි. මා කතා බහ කළ සිංහළ උදවිය ආගන්තුක සත්කාරයට ලැදි, එසේම සුහද බවින් අගතැන්පත් කාරුණික පිරිසක් බව මට පසක් විය.

මේ උත්සවය සංවිධානය කිරීමේ මූලිකත්වය ගෙන සිටියේ සොඳුරු සර සංස්කාරක මඩුල්ලේ නිරංජලා මනෝහාරී මහත්මියයි. ඇය අප ලංකාවිත්ති පුවත් පතට ලිපි ලියන ලේඛිකාවකි. එසේම ලංකාවිත්ති සයිප්‍රසයේ සිංහළ පාඨකයින් අතර බෙදාහරින්නේද ඇයයි.

ඒ උත්සවයට ලන්ඩනයේ පදිංචි නිතිඥ යුවලකද්, තවත් සිංහළ යුවලක් ප්‍රංශයේ පැරිස් නගරයෙන්ද නෙදර්ලන්තයේ පදිංචි සිංහළ තරුණියක් වන එරංගා පෙරේරා ද පැමිණ සිටියෝය. එසේම ශ්‍රීලංකාවේ සිට ප්‍රධාන අමුත්තා වශයෙන් ආරාධනා ලැබ උතුරු මැද පළාතේ ආණ්ඩුකාර ධූරය හොබවන ජනප්‍රිය ගායක කරුණාරත්න දිවුල්ගනේ මහතා පැමිණ සිටි අතර ශ්‍රීලංකාවේ ලංකාදීප පත්‍රයේ ශාන්ත කුමාර විතාන, ඇ සහරාවේ සංස්කාරක ධනුජය සේනානායක සහ ජනප්‍රිය ලේඛිකාවක වන චන්දි කොඩිකාරද පැමිණ සිටියහ. සයිප්‍රසයේ කොන්සියුලේට් කායඨයාලයේ නියෝජ්‍ය මේජර් උදිත සේනාරත්න මහතාද ශ්‍රීලංකාවේ ලංකා බැංකු මූලස්ථානයෙන් නිලධාරි මහතුන් කීප දෙනෙක්ද මෙම ප්‍රසංගයට සහභාගී වී තිබිණ.

ප්‍රසංගය පැවතියේ ජනවාරි 18 වන ඉරිදා දහවල් නිකොසියාහි **PEO** රංග ශාලාවේය. එදිනට නියමිතව තිබූ තවත් කායඨයක් වූයේ සයිප්‍රසයේ පැවති ආධුනික ගීතරඟයකින් මුල් තැන දිනූ සිංහළ තරුණයෙකු හා තරුණියක වන ස්වර්ණලතා මුණසිංහ සහ සුජිත් දිලන්ත විජේසූරියගේ ගායනා රැගත් සී. ඩී. තැටියක් නිකුත් කිරීමයි. මේ සියල්ලේ බරපැන දරන ලද්දේ නිරංජලා මනෝහාරී විසින් බව දැනගතිමි.

සිංහළ නැටුම් ගැයුම් වැයුම් මෙන්ම හරබර සිංහළ කථනයද සයිප්‍රසය වැනි මධ්‍යධරණී රටක වේදිකාවක අසන්නට ලැබීම සොම්නස දනවන්නකි. කරුණාරත්න දිවුල්ගනේ සිය ගායන මහිමයෙන් එදා එහිදී සංවේදී සිත් කම්පනය කළ බවට සැක නැත. එදා වේදිකාවේ සංගීතය සැපයූ සයිප්‍රසයේ සිංහළ තරුණ සංගීත ශිල්පීන්ගේ කුසල තාව සැබැවින්ම ප්‍රශංසනීයය. ප්‍රසංගයේ යම් අඩුපාඩුකම් තිබුණද සියල්ල සොම්නසින් අවසන් විය. අප වෙසෙන ලන්ඩනය මෙන් නොව සයිප්‍රසය වැනි නුහුරු රටක දුෂ්කර රැකියාවන්හි නිරතවෙමින් සිංහළ සංස්කෘතික සෞන්දයඨයට නැඹුරුවන්නට වේලාවක් ඇත්ද? එවැනි ප්‍රසංග සංවිධානය කිරීම ලෙහෙසි දෙයක් නොවේ. නිරංජලා මනෝහාරී මහත්මියගේ ධෛයඨය ගැන පුදුම හිතේ. මෙම සොඳුරු සර ප්‍රසංගය සාර්ථක කරගැන්මට සයිප්‍රසයේ ශ්‍රීලංකා සුබ සාධක සංගමයේ වජිර වික්‍රමසිංහ මහතාගෙන් පූර්ණ අනුග්‍රහය ලැබුණු බව ඇය කෘතඥ පූර්වකව පවසයි.

සයිප්‍රසය පිළිබඳ සුපහන් සිතින් මම නික්ම ආවෙමි.

♦ දයා ආනන්ද




සොඳුරු ගීසර CD තැටිය

---

# මා කැමති ඔබ කැමති ✻ ගීයක්



ගායක - වීරසිරි මල්වත්ත

අද දවසේ අප කාගේත් කතා බහ අවධානය පෙර කිසි කලෙක නොවූ තරම් යොමුව ඇත්තේ අපේ රට ගැනයි. එහි ජීවිත පූජාවෙන් සටන් වැද සිටින වීරෝදාර සෙබළ සමූහයා ගැනයි. ඒ දහස් ගණනක් රණවිරුවන් කෙරෙහි අසීමිතව හද උණුසුම් වන ගීතයකි මේ. මේ ගීයත් මේ සමග පළවන සටහනත් අපට එව්වේ නෙදර්ලන්තයේ වෙසෙන එරංගා පෙරේරායි.

## සටන් බිමේ මියැදුනාට මගෙ අඩුවක් දැනෙන් නෙපා...!



තරු පායපු නිල් අහසට සවන් යොමාගෙන ඉඳිද්දි
හිතේ උපන් රන් සිතුවිලි හදවත යට ගිනි ගනිද්දි
ඇත ඉඳන් අම්මේ නුඹ මං ගැන හිත ඉකි බිඳිද්දි
මව් සෙනෙහෙට හද සැලුනා සටන් බිමේ යුද වදිද්දි

ගිගුම් හඬින් පුපුරා යන වෙඩි හඬ තාමත් ඇහෙනව
මං ගැන නුඹ හඬන හැඬුම් ඊට වඩා මට ඇහෙනව
අම්මේ නුඹ අතින් ඉඳුණු බතේ සුවඳ මට දැනෙනවා
සටන් බිමෙත් මගෙ අම්මා මං ළඟ බව මට හිතෙනව

සටන් බිමේ මරු දැක දැක නෑ කිසි විටෙකදි සැලෙන්නෙ
බිව් මව් කිරි නිසයි මගේ එඩිතරකම ළය රැඳෙන්නෙ
මගෙ රට දැය රකින්නටයි දිවි නොතකා අවි දරන්නෙ
මට දුක මං මැරුණු දාට මව්පියො කවුරුද රකින්නෙ?

සෙනෙහෙ ගඟක් කඳුළු වෙලා ගලා යන්න දෙන්න එපා
අනේ අම්මෙ නුඹ මං ගැන තව තැවි තැවි ඉන්න එපා
නිවාඩුවට ආපු දාට කඳුළින් සිප ගන්න එපා
සටන් බිමේ මියැදුනාට මගෙ අඩුවක් දැනෙන් නෙපා

**ත**රු පායපු නිල් අහසට
සවන් යොමාගෙන ඉඳිද්දි
හිතේ උපන් රන් සිතුවිලි
හදවත යට ගිනිගනිද්දි

මේ ගීතය අසා නිමවනවාත් සමග මට සුසුමක් හෙළිණ. වීරසිරි මල්වත්ත ගායකයාගේ සුමියුරු හඬින් ගැයෙන මේ ගීය කී වරක් මා සවන් රස වින්දාදැයි නොදනිමි. අසන සෑම ඉසිඹුවකදීම දෙනෙත කඳුළින් බොඳව ගිය බව හා මනස උතුරා ගිය බව නම් මතකය.

බොහෝ දේ සිදුවන නිල් අහස යට, තල් කොළයත්, පොල් කොළයත් එකට යා කරන්නට නිල ඇඳුම් ඇඟලා සිය දිවි දෙවැනි කොට සටන් වදින අපේම සොයුරු සොයුරියන් සහ හැඬූ කඳුලෙන් වේදනාවෙන් කල් ගෙවන ඔවුන්ගේ ආදරණීය යන්ගේ සිතුම් පෙළක් දැස අබියස නිරායාසයෙන් පෙළ ගැසෙන තරමටම ඔහුගේ ආදරණීය රාවයෙන් වේදනාත්මක ස්වරයෙන් ගයන මේ ගීය අගය කළ යුතුය.

සදාදරණීය මතක සුවඳ රණ බිමේදී නොඅඩුව දැනෙයි. ඒ සුවඳ නැවත විඳගන්නට නොඉවසිල්ලෙන් පසුවන එඩිතර බව සිතේ රඳවා නේක රළු බොරළු හද තුළ සඟවා ඉදිරියටම ඇදෙන මොවුන් දැනුදු මට මැවී පෙනෙයි. හිතක ගැඹුරුම තැන ස්පර්ශ කරන මෙපද අසන සෑම විටම මව්බිමේ උරුමය රැක දෙන්න සටනේ යෙදෙන වීරෝදාර සොයුරු සොයුරියන් වෙනුවෙන් මසිත ලැගුම් ගත් නොනිමි සෙනෙහස අසිමිතව තවත් දළුලයි. ඔවුන්ගේ කැපවීමට හා ජීවිත පරිත්‍යාගයට කොපමණ පුද සත්කාර කළත් ඒ කිසිවක් ප්‍රමාණ වෙත්දැයි මට නිතර සිතේ.

♦ එරංගා පෙරේරා
Netherlands

---

# Three Indian Wives

Three men were sitting together bragging about how they had given their new wives duties.

The first man had married a woman from New Delhi, and bragged that he had told his wife she was going to do all the dishes and house cleaning.

He said it took a couple days but on the third day he came home to a clean house and the dishes were done.

The second man had married a woman from Bombay. He bragged that he had given his wife orders that she was to do all the cleaning, dishes and the cooking.

On the first day he didn't see any results, the next day it was better. By the third day, his house was clean, the dishes were done and he had a huge dinner on the table.

The third man had married a Punjabi girl. He boasted that he told her that her duties were to keep the house cleaned, dishes washed, lawn mowed, laundry washed and hot meals on the table for every meal.

He said the first day he didn't see anything, the second day he didn't see anything but by the third day most of the swelling had gone down and he could see a little out of his left eye.

**ඉ**න්දියානු මිනිසුන් තිදෙනෙක් එක්වී කතාකරමින් සිටියේ ඔවුන් විවාහ වී අළුතින් ගෙදරට ගෙන ආ බිරියන් ගැනය.

පළමුවැන්නා ගේ බිරිඳ නව දිල්ලියේ ගැහැණියකි. ඔහු ආඩම්බරයෙන් කීවේ පළමු දවසේම ඔහු ඇයට ගෙදර සියළු වැඩ හා අතුපතු ගෑම් පිරිසිදු කිරීම් සියල්ල කළයුතු යයි අණ දුන් බවයි. පළමු දින දෙකේ කිසි වෙනසක් නොවූවත් තුන්වන දිනයේ ඔහු නිවසට එන විට ඇය ඒ සියල්ල ඉටුකර නිවස පිරිසිදුව තිබුණු බවත් ය.

දෙවැන්නා විවාහ වී සිටියේ බොම්බායෙනි. “ මම එයාට කිව්වා උඹ ගෙදර සේරම වැඩ කරන්න ඕන. උයන්න ඕන. රෙදි-සෝදන්න ඕන. ගේ පිළිවෙලට තියන්න ඕන කියලා. ඉතින් පළමු දවසෙ වෙනසක් තිබුණෙ නෑ. දෙවෙනි දවසෙ ටිකක් හොඳයි. තුන්වෙනි දවසෙ ටිප් ටොප් එකට හැම දේම කරලා තිබුණා.”

තුන්වැනි මිනිසා ගෙදරට ගෙන ආවේ පන්ජාබ් කාන්තාවකි. ඔහු මෙසේ පැවසීය. “ මමත් ඔය වගේම අළුත ගෙනා මගේ ගෑණිට කිව්වා... උඹ මේ ගෙදර සේරම වැඩපළ කරන්න ඕන.... අතුපතුගාන්න ඕන.... රෙදි සේරම හෝදන්න ඕන.... කඩේට ගිහින් බඩු ගේන්න ඕන.... මම එන කොට කෑම ටික මේසෙ උඩ ලෑස්ති වෙලා තියෙන්න ඕන කියලා...”

“ පළවෙනි දවසෙ කිසිම දෙයක් පෙනුණෙ නැහැ.... දෙවෙනි දවසෙත් කිසි දෙයක් පෙනුණෙ නෑ.... තුන්වෙනි දවස වෙනකොට මට යාන්තම් පේන්න පටන් ගත්තා.... එතකොට මේ එක ඇහැක ඉදිමුම ඩිංගක් බැහැලා තිබුණා....”

♦ Kirthi M.